*සැ. යු.*- 2018.09.21 දින පළ වූ අංක 2,090 දරන *ගැසට් පත්‍රයේ* I : III සහ IV(අ) කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,091 - 2018 සැප්තැම්බර් මස 28 වැනි සිකුරාදා - 2018.09.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහේස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම ... ... ... | 678 |
| මුදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | 679 |

*සැ. යු.* - (i) ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත් කෙටුම්පත 2018 සැප්තැම්බර් මස 14 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(ii) විසර්ජන පනත් කෙටුම්පත 2018 සැප්තැම්බර් මස 21 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2018 ඔක්තෝබර් මස 19 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2018 ඔක්තෝබර් මස 05 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."**

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2018 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය www. documents.gov. lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පිස්කල් විකිණීම්

## පිස්කල් මගින් වෙන්දේසියේ විකිණීමයි

### කොළඹ දී පවත්වනු ලබන බස්නාහිර පළාතේ වාණිජ මහාධිකරණයේ දී ය (සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරන)

එල්. බී. ෆිනෑන්ස් පී.එල්.සී.
අංක 275/75,
මහාචාර්ය ස්ටැන්ලි විජේසුන්දර මාවත,
කොළඹ 07.

..............................*පැමිණිලිකරු.*

නඩු අංක : HC/Civil/05/08/MR
ඇස්කීසි අංකය : 24/2011

*එදිරිව*

01. සුවිසත මෝටර් හවුස් කම්පැනි ප්‍රයිවට් ලිමිටඩ්,
284/4බී, බේස්ලයින් පාර,
දළුවකොටුව, කොච්චිකඩේ.
*නව ලිපිනය* : 247/5, බේස්ලයින් පාර,
දළුවකොටුව, කොච්චිකඩේ.

02. දුම්බර මඩවලගේ කොන්සින් ගෙදර සුමනාවතී,
284/4බී, බේස්ලයින් පාර,
දළුවකොටුව, කොච්චිකඩේ.
*නව ලිපිනය* : 247/5, බේස්ලයින් පාර,
දළුවකොටුව, කොච්චිකඩේ.

03. බෝදාවඩුගේ සංජීව ගුණතිලක,
247/5, බේස්ලයින් පාර,
දළුවකොටුව, කොච්චිකඩේ.
*සහ*
සුවිසත මෝටර් හවුස් කම්පැනි ප්‍රයිවට් ලිමිටඩ්,
63ඒ, ප්‍රින්ස් ඔෆ් වේල්ස් ඇවනිවු,
කොළඹ 14.

04. අරුමා බදුගේ නිලූෂි රසාංජලී ද සිල්වා,
අංක 247/4,
දළුවකොටුව, කොච්චිකඩේ.

..............................*විත්තිකරුවන්.*

වර්ෂ 2009ක් වූ සැප්තැම්බර් මස 15 වැනි දින දරන කොළඹ වාණිජ මහාධිකරණයේ ඇතුළත් කරන ලද නඩු තීන්දුව පරිදි ඉහත විත්තිකරුවන් විසින් පැමිණිලිකරුට ගෙවිය යුතු රු. 177,592/-ක මුදලක් සහ ඒ මත 2007.03.27 වැනි දින සිට එකී මුදල් ගෙවා නිම කරන තෙක් වසරකට 48%ක් බැගින් වූ පොලියක් ද අංක WP LA 3557 දරන වාහනයේ භුක්තිය යලිත් පැමිණිලිකාර සමාගමට බාරදෙනු ලබන දින තෙක් බදු ගිවිසුම කඩ කිරීම වෙනුවෙන් පැමිණිලිකරුට වන්දි වශයෙන් මසකට රු. 41,303/-ක් බැගින් ද, අංක WP LA 3557 දරන වාහනය යහපත් සහ මනා ක්‍රියාකාරිත්වයෙන් යුතුව පැමිණිලිකරුට ආපසු බාර දෙන ලෙස හෝ විකල්ප ලෙස එහි වටිනාකම වන රු. 1,213,043/-ක මුදලක් ද, 2007.05.28 වැනි දිනට රු. 1,671,666/- මුදලක් අලාභ ලෙස ලබා දෙන ලෙසත් එකී දින සිට එම මුදල මත එය ගෙවා නිම කරන තෙක් වසරකට 48% බැගින් වූ පොලියක් ද, නඩු ගාස්තු ද, ගෙවීමට ඉහත 01 වැනි, 02 වැනි, 03 වැනි සහ 04 වැනි විත්තිකරුවන් අපොහොසත් වී ඇති බැවින් එම නඩුවේ නිකුත් වී ඇති දේපළ තහනමට ගැනීමේ ආඥාව මත 2011.10.05 වැනි දින තහනමට ගන්නා ලද 04 වැනි විත්තිකාරියට හිමි පහත උපලේඛනයේ සඳහන් දේපළ,

වර්ෂ 2018 ක් වූ ඔක්තෝබර් මස 26 වැනි දින ප. ව. 2.00ට එම දේපල පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබනු බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

තව ද, එම වෙන්දේසියේ දී ලංසු තබා දේපළ මිලදී ගන්නා ගැණුම්කරු විසින් වෙන්දේසි මුදල හෝ එම මුදලින් 25%ක් ද වෙන්දේසි ගාස්තු හා රජයේ ගාස්තු මෙම වෙන්දේසිය අවසන් වූ වහාම මුදලින් ගෙවිය යුතු අතර, ඉතිරි 75%ක් දින 30ක් ඇතුළත මෙම අධිකරණයේ තැන්පත් කළ යුතු ය.

*පිවිසුම.*- කොළඹ හලාවත මාර්ගයේ කොච්චිකඩේ, දළුවකොටුව හන්දියේ සිට බේස්ලයින් පාරේ, මීටර් 500 ක් පමණ දුරින්,

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරලයේ, දූනගහ පත්තුවේ දූනට මීගමුව මහ නගර සභා සීමාව තුළ දළුවකොටුවේ පිහිටි සින්නමෝල නැමැති ඉඩම ඊ. ඩී. ඕ. කොරයා මානක තැන 1980 අප්‍රේල් 4 සහ 5 වන දින මැන සාදන ලද අංක 538 ඒ දරන සැලැස්මේ ලොට් 8421/1 දරන කොටස, උතුරු-නැගෙනහිරට (ඊසානට) : ලෙවිස් බාස්ගේ ඉඩම ද, දකුණු-නැගෙනහිරට (ගිණිකොණට) : ලොට් 8421/2 දරන කොටස , දකුණු-බස්නාහිරට (නිරිතට) : බේස්ලයින් පාර ද, උතුරු-බස්නාහිරට (වයඹට) : අර්ල් ප්‍රනාන්දුගේ ඉඩම ද, යන මායිම් තුළ වූ පර්චස් දහ හතරයි දශම හතයි අටක් (අ. 0, රූ. 0, පර්. 14.78) විශාල ඉඩම සහ එහි පිහිටි ගහකොළ ගොඩනැගිලි ආදී සියලුම දෙයත් සමග වේ. මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඊ 554/131 දරන පත් ඉරුවේ සඳහන් ඉඩම වේ.

බී. ජේ. ගිලානි ද සිල්වා,
රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
වාණිජ මහාධිකරණය,
කොළඹ 12.

2018 ක් වූ අගෝස්තු මස 27 වැනි දින දී ය.

09-890

---

# විවිධ දැන්වීම්

## 2000 අංක 21 දරන ශ්‍රී ලංකා බදුකරණ කාර්යායතනය (සංස්ථාගත කිරීමේ) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

එස්. එම්. මරික්කාර් වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 53(1) යටතේ 2000 අංක 21 දරන ශ්‍රී ලංකා බදුකරණ කාර්යායතන (සංස්ථාගත කිරීමේ) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි'', යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණු වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථවලින් යුක්තව, ශ්‍රී ලංකා බදුකරණ කාර්යායතනයේ සිය නාමය ශ්‍රී ලංකා වරලත් බදුකරණ ආයතනය ලෙස වෙනස් කිරීමය.

1. බදු නීතිය හා එහි ප්‍රායෝගික බව පිළිබඳව උපදෙස් ලබාදෙන තැනැත්තන් සඳහා වෘත්තීය ආයතනයක් පිහිටුවීම සඳහා විධිවිධාන සැලැස්වීම,

2. සාමාජිකයන් සඳහා හෝ සාමාජිකයන් වීම සඳහා සුදුසුකම් ලැබීමට අපේක්ෂා කරන තැනැත්තන් සඳහා පාඨමාලා නියම කිරීම හා පැවැත්වීම හෝ අනුමත කිරීම සහ අවශ්‍ය වෘත්තිමය සුදුසුකම් ප්‍රදානය කිරීම,

ආදිය.

එස්. එම්. මරික්කාර්,
පාර්ලිමේන්තු මන්ත්‍රී,
කොළඹ දිස්ත්‍රික්කය.

09-767

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.